28

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1908/24 - 2015 මාර්තු මස 31 වැනි අඟහරුවාදා - 2015.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(xii).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

**27(1) වන වගන්තිය යටතේ නියමය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම වන මම, මේ නියමය මගින්, ශ්‍රී ලංකාවේ කැළණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වනු ලබන්නා වූ 2006 ජූලි මස 22 වන දින අංක 1454/37 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කලින් කළ සංශෝධිත නියමය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, එහි උපලේඛනයේ I වන තීරයේ සමාජීය විද්‍යා පීඨය යන සටහනට අනුරූප වන්නා වූ II වන තීරයේ අංක 08 යන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අයිතමය එකතු කිරීම මගින්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"9. ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය"

ආචාර්ය සරත් අමුණුගම,<br>
උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය.

2015 මාර්තු මස 30 වැනි දින,<br>
කොළඹ දී ය.

04-547

1A - PG 2424 — 503 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.